කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2011/2012
2014 අප්‍රේල්/මැයි/ජූනි

**සමාජීය විද්‍යා පීඨය**

**සංවර්ධන අධ්‍යයනය - DVST - E 3025**

**මානව සම්පත් සංවර්ධනය සහ සංවර්ධන අධ්‍යයන පර්යේෂණ විධි**

**එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් (02) තෝරාගෙන**
**<u>ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.</u>**

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

## 1 කොටස - මානව සම්පත් සංවර්ධනය

01. (අ) මානව සම්පත් සංවර්ධන සංකල්පය හඳුන්වන්න.
(ආ) සංවර්ධනය වෙමින් පවත්නා රටවල මානව සම්පත් සංවර්ධනයේ අවශ්‍යතාව පහදන්න.

02. රටක ජනතාවගේ සෞඛ්‍යය හා සංවර්ධනය අතරැති අනුලෝම සබඳතාව උචිත නිදසුන් භාවිතයෙන් විමර්ශනය කරන්න.

03. ශ්‍රී ලංකාවේ මානව සම්පත් පදනම ශක්තිමත් කිරීම සඳහා පසුගිය දශකය තුලදී රජය ගෙනඇති ක්‍රියාමාර්ග සැකෙවින් දක්වන්න.

04. මතු දැක්වෙන දර්ශක අතුරින් <u>දෙකක්</u> (02) තෝරාගෙන, ඒවා භාවිතයෙන් විවිධ සංවර්ධන මට්ටම් හඳුනාගැනීම සඳහා කොතෙක් දුරට යොදාගත හැකිදැයි විමසන්න.

අ) මානව සංවර්ධන දර්ශකය (Human Development Index)

ආ) මානව දරිද්‍රතා දර්ශකය (Human Poverty Index)

ඇ) භෞතික ජීවන තත්ත්ව දර්ශකය (Physical Quality of Life Index)

ඈ) ස්ත්‍රී පුරුෂ අසමානතාව පිළිබඳ දර්ශකය (Gender Inequality Index)

## 2 කොටස - සංවර්ධන අධ්‍යයන පර්යේෂණ විධි

05. (අ) ප්‍රමාණාත්මක හා ගුණාත්මක (Quantitative and Qualitative ) පර්යේෂණ මොනවාද?

(ආ) ඉහත 'අ' හි දැක්වූ පර්යේෂණ දෙවර්ගයේ ඇති ගති ලක්ෂණ වෙන් වෙන්ව දක්වන්න.

(ඇ) සංවර්ධන අධ්‍යයන විෂයයට අදාළ පර්යේෂණ සඳහා උක්ත පර්යේෂණ වර්ග යොදා ගත හැකි අයුරු කෙටියෙන් දක්වන්න.

06. පර්යේෂණ ගැටලුවක් හඳුනාගැනීම සඳහා සාහිත්‍ය විමර්ශණයේ ප්‍රයෝජනවත් භාවය පරීක්ෂා කරන්න.

07. තෝරාගත් ග්‍රාම නිලධාරී වසමක සංවර්ධන සැළසුමක් සකස් කිරීම සඳහා සසම්භාවී නොවන නියදුම් ක්‍රමයක් (non – random sample) භාවිතා කිරීමෙන් දත්ත හා තොරතුරු ලබා ගන්නා ආකාරය පියවරෙන් පියවර පැහැදිලි කරන්න.

08. දත්ත විශ්ලේෂණයේදී විස්තරාත්මක සංඛ්‍යානය (Descriptive Statistics) කොතෙක් දුරට යොදාගත හැකිදැයි විමසන්න.